Prepared by-N.K.A.Shrimathi
R/Mihindu Vidyalaya

**නිපුණතාව 04 - විවිධ අත්දැකීම් ඇසුරු කර ගනිමින් නිර්මාණකරණයේ යෙදේ.**

**නිපුණතා මට්ටම - 4 .3 කෙටි මුද්‍රා නාට්‍යක් නිර්මාණය කරයි**

**ක්‍රියාකාරකම 4.3 - කෙටි මුද්‍රා නාට්‍යක් නිර්මාණය කරමු.**

- **නිවැරදි පිළිතුර තෝරන්න.**

1.චලන මාධ්‍ය කොටගෙන භාවමය සංගීතයක් යොදා ගනිමින් සිද්ධියක් රගපෑම අපරදිග රටවල හැදින්වූයේ .................... ,

1.ගීත නාට්‍ය ලෙසිනි. 2. බැලේ නාට්‍ය ලෙසිනි. 3.ශෛලිගත නාට්‍යක් ලෙසිනි. 4.තාත්වික නාට්‍ය ලෙසිනි.

2.දේශීය මුද්‍රා නාට්‍ය කලාවේ ආරම්භයට හේතුවූ “ශාප මෝචන් ¶ නැමැති මුද්‍රා නාට්‍ය නිර්මාණය කරන ලද්දේ ....................... ,

1.රබීන්ද්‍රනාත්තාගොර් තුමාය. 2.ශාන්ති දේව් ගෝෂ්ය. 3.නිමල් වෙල්ගම මහතාය. 4.ශේෂා පලිහක්කාර මහතාය.

3.1940 දශකයේ මුද්‍රා නාට්‍ය කලාවේ ආරම්භක ශිල්පයෙකු වූයේ .................................. ,

1.මිරන්ඩා හේමලතා මහත්මියයි. 2.ඒ.ඉඹුල්ගොඩ මහතාය. 3.සීබට් ඩයස්ය. 4.වසන්ත කුමාර මහතාය.

4. මුද්‍රා නාට්‍යක් රග දැක්වීමේදී භාවිතයට නොගන්නා අභිනය වන්නේ .............................. ,

1.වාචික අභිනයයි. 2.සාත්වික අභිනයයි. 3.ආහාර්ය අභිනයයි. 4.ආංගික අභිනයයි.

5. මුද්‍රා නාට්‍යක නිර්මාණ කාර්යය අපහසු එකක් බවට පත්විය හැක්කේ ........................ නිර්මාණයෙනි ,

1. කාලීන පුවතක් 2.ඉතිහාසගත පුවතක් 3.මන:කල්පිත පුවතක් 4.අප්‍රකට කතා පුවතක්

- **හිස්තැනට සුදුසු පිළිතුර යොදන්න.**

6.දේශීය මුද්‍රා නාට්‍ය ........................... යනුවෙන් 50 දශකයේදී හදුන්වන ලදී.
7. ....................... මුද්‍රා නාට්‍ය 1936 නිශ්පාදනය කරන ලද ප්‍රථම මුද්‍රා නාට්‍යයි.
8. .................... යන මුද්‍රා නාට්‍ය ඉන්දියානු කතා තේමා සහිතව නිශ්පාදනය වුනි .
9.ආගමික දේව ප්‍රතිමා නෙලිමේදි හෝ ඇදීමේදි ................................ මුද්‍රා භාවිතා කරයි.
10.“ඇත කඳුකර හිමව් අරණේ.... ගීතය මුද්‍රා නාට්‍යයේ ගීතයකි.

- **ප්‍රශ්න සියල්ලට පිළිතුරු සපයන්න.**

11.කෙටි මුද්‍රා නාට්‍යකට සුදුසු තේමාවක් ලියන්න.
12.කණ්ඩායමක් ලෙස කෙටි මුද්‍රා නාට්‍යයක් නිර්මාණය කරන්න.
13.කණ්ඩායම් සාමූහිකව නායකත්වයට ගරු කරමින් මුද්‍රා නාට්‍ය නිර්මානකරනයේ යෙදෙන ඇකාරය විස්තර කනරන්න.
14.මුද්‍රා නාට්‍යක සංගීතය ප්‍රබලම ප්‍රකාශන මාධ්‍යක් වෙයි.විමසන්න.